**ශීර්ෂය 292 - සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී

සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන් ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.

- හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) පුනරාවර්ථන වියදම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අතැති බිල්පත් වටිනාකම රු.51,382,223 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වුව ද නියැදි පරීක්ෂාවට අනුව රු.3,713,753 ක බැරකම් අඩුවෙන් දක්වා තිබුණි. | ලැබුණු සියලුම වවුචර්පත් බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර ඇති බව. | කාලපරිච්ඡේදයට අදාළ බැරකම් සියල්ල හෙළිදරව් කළ යුතුය. |

**(ආ) මූලධන වියදම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශීර්ෂ 292-2 සංවර්ධන වැඩසටහනේ ප්‍රතිපාදන ඉතිරිවීම්වලට හේතු දැක්වීමේ ප්‍රකාශනයේ, ඒසීඒ 2(ii) ආකෘතියේ 292-2-2-19-2507 වැය විෂයෙහි ඉතිරිවීම් ශේෂය රු.2,026,000 ක් වුවද, භාණ්ඩාගාර මුද්‍රිත සටහන්, එස්ඒ-10 ආකෘතියේ වියදම් සාරාංශයෙහි සඳහන් ඉතිරිවීම් ශේෂය රු.13,331,000 ක් වූයෙන් රු.11,305,000 ක වෙනසක් පැවතුණි. | පරිගණක ගත කිරීමේ දී සිදුවූ වෙනසක් බව. | දෙපාර්තමේන්තු ගිණුම් භාණ්ඩාගාර ගිණුම් සමඟ සැසඳිය යුතුය. |

**(ඇ) රාජ්‍ය නිලධාරින්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විෂය අංක 29201 දරන රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය හා භාණ්ඩාගාර පොත් අනුව ශේෂය අතර 2015 වර්ෂයේ සිට පැවත එන රු.100,125 ක වෙනස නිරවුල් නොකර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | එම ණය ශේෂය නිරවුල් කිරීමට ප්‍රමාණවත් තොරතුරු නොමැති බැවින් පොත්වලින් කපාහැරීමට කටයුතු කරන බව. | දෙපාර්තමේන්තු ගිණුම් භාණ්ඩාගාර ගිණුම් සමඟ සැසඳිය යුතුය. |

### 1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරීක්ෂා කළ හැකි වන පරිදි බැරකම් ලේඛනයක සටහන් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාළ රු.51,382,223 ක බැරකම් ලේඛනයක සටහන් කර නොතිබුණි. | පිළිතුරු සපයා නැත. | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරීක්ෂා කළ හැකි පරිදි බැරකම් ලේඛනයක සටහන් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | පිළිගන්නා බව. | ගිවිසුම් ප්‍රකාරව අදාළ මුදල් අය කරගත යුතුය. |
| | XV පරිච්ඡේදයේ 4 ඡේදය | 17,299,301 | අධ්‍යයන, අභ්‍යාස හෝ රාජකාරී කටයුතු සඳහා විදේශගත වූ නිලධාරීන් 09 දෙනෙකු නැවත සේවයට වාර්තා කර නොතිබීම හේතුවෙන් අනිවාර්ය සේවා කාලයක් සේවය කිරීම සඳහා එළඹී ගිවිසුම කඩ කිරීම නිසා එම නිලධාරීන්ගෙන් අය විය යුතු දඩ මුදල් අය කරගෙන නොතිබුණි. | පසුව පිළිතුරු සපයන බව. | දෙපාර්තමේන්තුවේ මාරුවීම් |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශිත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ xviii පරිච්ඡේදයේ193 රීතිය | - | සෑම රජයේ නිලධාරියෙක්ම සේවා කාලය අවුරුදු 5 ක් සම්පූර්ණ වූ විට ස්ථාන මාරුවීම්වලට යටත් විය යුතු වුවත් වසර 15 ක් එකම ස්ථානයේ සේවය කිරීමෙන් පසුව වුවද ස්ථාන මාරු නොකළ නිලධාරීන් 105 ක් සිටින බව නිරීක්ෂණය විය. තවද ඉන් නිලධාරීන් 33 ක් වසර 25 ට වැඩි කාලයක් එකම ස්ථානයේ සේවය කරමින් සිටි නිලධාරීන් විය. | ප්‍රතිපත්තිය අනුව කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලසුම් කිරීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කරඳගොල්ල සත්ත්ව පාලන විද්‍යාලයේ 2019/2021 අධ්‍යයන වර්ෂය සඳහා පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව NVQ 5, 6 මට්ටමට ලබා ගැනීමට අපේක්ෂිතව සිසුන් 67 දෙනෙකු ලියාපදිංචි කර තිබුණ ද අධ්‍යයන වර්ෂය අතරතුරදී සිසුන් 34 දෙනෙකු හෙවත් සියයට 51 ක ප්‍රමාණයක් පාඨමාලාව අත් හැර ගොස් තිබුණි. සිසුන් පාඨමාලා අතරමඟදී අතහැරයාම හේතුවෙන් පාඨමාලා හැදෑරීමට වෙනත් අයෙකුට තිබෙන අවස්ථාව මඟහැරී යාමද, අතහැර ගිය සිසුන් සඳහා දරන ලද වියදම නිෂ්කාර්ය වියදමක් වීමද සිදුවන බවත්, මේ හේතුවෙන් සත්ත්ව පාලන ක්ෂේත්‍රයේ සංවර්ධනය කෙරෙහි අහිතකර ලෙස එය බල පෑ හැකි බවත් නිරීක්ෂණය විය. | කොවිඩ් - 19 වසංගත තත්ත්වය මත සත්ත්ව පාලන විද්‍යාල වසා තැබීම නිසා පාඨමාලා කාලය දීර්ඝවීම නිසා සිසුන් හැරයාම සිදු වූ බව. | සිසුන් රඳවාගත හැකි පරිදි පාඨමාලාව සැලසුම් කළ යුතුය. |

**3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අතිරේක ලේකම්ගේ (පාලන හා මූල්‍ය) අංක PSC/EST/7/4/2/2012 හා 2017 ජුනි 28 දිනැති ලිපිය අනුව පර්යේෂණ සහකාර විශේෂ ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වෙනම ස්ථාන මාරු පරිපාටියක් සකස් කර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගත යුතු බව එම කොමිෂන් සභා තීරණය පරිදි දක්වා තිබුණ ද 2021 දෙසැම්බර් 31 වන විටත් එම කාර්යය සිදුකර නොතිබුණි. | පිළිතුරු පසුව ඉදිරිපත් කරන බව. | කොමිෂන් සභාවේ තීරණය පරිදි කටයුතු කළ යුතුය. |

**3.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පොල්ගොල්ල සත්ත්ව විෂාණු රසායනාගාරයේ වැඩි දියුණු කිරීම් හා අලුත්වැඩියා කිරීම වෙනුවෙන් 2018 අගෝස්තු 24 දින තෝරාගත් කොන්ත්‍රාත්කරුවෙකුට 2018 දෙසැම්බර් 29 දිනට පෙර වැඩ අවසන් කිරීම සඳහා රු.3,273,873 ක වටිනාකමකට ගිවිසුම්ගතව කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. කොන්ත්‍රාත්තුවේ අලුත්වැඩියා කිරීම් අවසන් නොකර කොන්ත්‍රාත්කරු කොන්ත්‍රාත්තුව අත්හැරදමා තිබියදී 2020 අගෝස්තු 11 දින කොන්ත්‍රාත් ගිවිසුම අවලංගු කර තිබුණි. කෙසේ වුවද රසායනාගාරයේ අලුත්වැඩියාවන් නිසි පරිදි සිදු නොකිරීම හේතුවෙන් නියමිත අයුරින් ජීවාණුහරණ ක්‍රියාවලියක් සිදුකර ගැනීමට නොහැකි වීමත්, රසායනාගාරයේ පර්යේෂණ කටයුතු, එන්නත් සාර නිෂ්පාදන කටයුතු බලවත් අපහසුතා සහිතව සිදු කරන බවත් නිරීක්ෂණය වූ අතර සමාලෝචිත වර්ෂයේදී ද නැවත අලුත්වැඩියා කිරීම් ආරම්භ කර නොතිබුණි. | ගිවිසුම් අත්සන් කර වසර 2 කට ආසන්න කාලයක් ගතවුවද, වැඩ අවසන් නොකිරීම නිසා 2020 අගෝස්තු 11 දින ගිවිසුම අවසන් කරන ලද බව සහ සම්පූර්ණ නොකළ වැඩ ඉදිරියේ දී සම්පූර්න කිරීමට පියවර ගන්නා බව. | සත්ත්ව විෂාණු රසායනාගාරයේ සැලසුම් අනුව අවශ්‍ය නඩත්තු කටයුතු කළ යුතුය. |

**3.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 අගෝස්තු 28 දිනැති අංක 2/2021 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් පරිදි වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙළ කළ යුතුව තිබුණු අතර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය අනුව එය වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. එහෙත් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේ දී නියමිත දිනට පෙර ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | විගණන පනත හා අදාළ චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතුය. |

**3.5 ප්‍රසම්පාදනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020 දෙසැම්බර් 30 දින අංක 924 සහ 2021 අප්‍රේල් 21 දින අංක 367 දරන වවුචර මඟින් පරිගනක යන්ත්‍ර 27 ක් හා යූපීඑස් 27 ක් මිලදී ගැනීම සඳහා රු.3,281,175 ක් ගෙවා තිබුණු අතර, ඒ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු අනාවරණය විය. | | |
| (i) පරිගණක යන්ත්‍ර සහ යූපීඑස් 27 ක අවශ්‍යතාවය කලින් හඳුනාගෙන තිබුණු අතර, එහි වටිනාකම රු.3,281,175 ක් විය. එය රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන කමිටු අධිකාරි සීමාව වන රු.මිලියන 25 ට අඩු ප්‍රධාන කොන්ත්‍රාත් භාණ්ඩ හා සේවා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු නිර්දේශ යටතේ මිලදී ගත යුතු උවද එම මිළදී ගැනීම ප්‍රසම්පාදන කමිටු අධිකාරි සීමාව රු.මිලියන 03 ට අඩු | කුණ්ඩසාලේ සත්ත්ව පාලන විද්‍යාලය විසින් මුල් පරිගණක 20 ඉල්ලුම් කරනු ලැබුවේ පාඨමාලා ලාභීන්ගේ අවශ්‍යතාවය සඳහා වන අතර, අමතර ඇණවුම් මඟින් ලබාගත් පරිගණක කාර්යාලයේ භාවිතය සඳහා ඉල්ලුම් කර ඇත. මුල් ඉල්ලීම් කරන අවස්ථාවේ අමතර ඇණවුම් මඟින් මිලදීගත් පරිගණකවල අවශ්‍යතාවය හඳුනාගෙන | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව නියමිත වටිනාකම්වලට අදාළ ප්‍රසම්පාදන කමිටු මඟින් කටයුතු කර තීරණ ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දෙපාර්තමේන්තු සුළු ප්‍රසම්පාදන කමිටු නිර්දේශය යටතේ අවස්ථා 02 කදී මිලදී ගැනීම සිදු කර තිබුණි. | නොතිබූ අතර, එය පසුව හඳුනාගත් බව. | |
| (ii) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.3 (ආ) ප්‍රකාරව රු.500,000 ක් ඉක්මවන භාණ්ඩ හෝ සේවා සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුම් ක්‍රියාත්මක කළ යුතු වුවද රු.3,281,175 ක් වටිනා පරිගණක හා යූපීඑස් මිලදී ගැනීම් සඳහා එසේ ලිඛිත ගිවිසුම්වලට එළඹ නොතිබුණි. | ඉදිරියේදී සිදුකරන ප්‍රසම්පාදන කටයුතුවලදී ඒ අනුව කටයුතු කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. |
| (ආ) | අභිජනන කටයුතු සඳහා 2019 අප්‍රේල් මාසයේදී ඕස්ට්‍රේලියාවෙන් එළුවන් 100 ක් ආනයනය කර තිබුණු අතර, එම එළුවන් අතරින් පිරිමි සතුන් 05 ක් සහ ගැහැණු සතුන් 16 ක් වශයෙන් එකතුව එළුවන් 21 ක් 2021 දෙසැම්බර් 31 දිනට මිය ගොස් තිබුණු අතර මිය ගිය එළුවන්ගේ වටිනාකම රු.8,036,275 ක් විය. මෙම වටිනාකම මූලික ආයෝජනයෙන් සියයට 21 ක් වන අතර, අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට පෙර මිය යාම තුළින් මෙම සතුන් සඳහා එතෙක් දරන ලද ආනයනික හා නඩත්තු වියදම් ඵලදායී නොවන බවද නිරීක්ෂණය විය. එමෙන්ම එළුවන් ආනයනය කිරීම සඳහා ප්‍රසම්පාදන මණ්ඩලය 2017 වර්ෂයේදී අනුමත කර තිබුණ ද, ආනයනය කර තිබුණේ 2019 වර්ෂයේදී බැවින් විනිමය අනුපාතයේ වෙනස්වීම මත රු.2,311,760 ක් අමතරව ගෙවීමට සිදුවී තිබුණි. | ආනයනික සතුන් නව පරිසර තත්ත්වයන්ට පරිවර්තනය කළ යුතු අතර, එසේ පරිවර්තනය නොවන සතුන් මියයාම අපේක්ෂිත තත්ත්වයක් බව.<br><br>ආනයනය ප්‍රමාදවූයේ සත්ත්ව සෞඛ්‍ය සහතිකය (Health Protocol) පිළිබඳව ඕස්ට්‍රේලියාවේ නිරෝධායන ආයතනය සහ ශ්‍රී ලංකාවේ නිරෝධායන අංශ අතර අවසන් එකඟතාවයට පැමිණීමට නොහැකිවීම නිසා බව. | ශ්‍රී ලංකාවේ දේශගුණයට ගැලපෙන සතුන් ආනයනය කිරීම සහ අලාභ අවම වන පරිදි කටයුතු කළ යුතුය. |

**3.6 වත්කම් කළමනාකරණය**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | -------------------------- | ------------ |
| (අ) | කරඳගොල්ල සත්ත්ව පාලන විද්‍යාලයේ ඩිප්ලෝමා පාඨමාලාව NVQ 5,6 මට්ටමට උසස් කිරීම සඳහා සම්පූර්ණ විය යුතු අවශ්‍යතා යටතේ ගිනි නිවීමේ උපකරණ සවි කිරීම | 2020 සහ 2021 වසරවලදී ප්‍රතිපාදන නොතිබුණු බැවින් එම කම්ප්ලිට් හෝස් රීල් ස්ථාපිත කිරීමට නොහැකි වූ බව. | වාර්ෂික ක්‍රියාකාරී සැලසුමේ ඇතුළත් කාර්යයන් නියමිත පරිදි ඉටු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සඳහා රු.675,800 ක් ගෙවා 2020 ඔක්තෝබර් 16 දින එම උපකරණ මිලදී ගෙන තිබුණි. එම උපකරණ සවි කිරීම සඳහා පද්ධතියට අයත් රු.213,500 ක මීටර් 30 (අඩි 100) දිග කම්ප්ලීට් හෝස් රීල් (Complete Hose Reel) 7 ක් ස්ථාපිත නොකර මිළදී ගත් උපකරණ ගබඩාවේ නිෂ්කාර්යව පැවතුණි. | | |
| (ආ) | ඉඹුලන්දණ්ඩ එළු අභිජනන මධ්‍යස්ථානය පිහිටි අක්කර 37 ක ඉඩමෙන් අක්කර 10 ක් ද, කරදගොල්ල කුකුල් පර්යේෂණ මධ්‍යස්ථානය පිහිටි අක්කර 25 ක ඉඩමෙන් අක්කර 06 ක් ද උපයෝජනය කර නොතිබුණි. | මෙම අක්කර 10 තුළ තෘණ වගාකර තිබුණ ද, වියළි කාලගුණය පැවති බැවින් වියළී ගොස් තිබෙන බව සහ කුකුල් පර්යේෂණ මධ්‍යස්ථානයේ අක්කර 6 භාවිතයට ගැනීමට සැලසුම් කර තිබෙන බව. | ආයතනයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ඉඩම් උපයෝජනය කළ යුතුය. |
| (ඇ) | කරදගොල්ල කුකුල් පර්යේෂණ මධ්‍යස්ථානයේ 2015 වර්ෂයේ එවකට පැවති තාරා කොටුව රු.1,562,000 ක් වැය කර ගව ගාලක් බවට පරිවර්තනය කර තිබුණ ද, එය 2021 දෙසැම්බර් 31 වන විටත් භාවිතයට ගෙන නොතිබුණි. | ප්‍රමාණවත් කාර්යමණ්ඩලයක් අනුමත කර ගැනීමට නොහැකි වූ බැවින් මෙම තත්ත්වය ඇතිවී තිබෙන බව. | සම්පත් උපරිම අයුරින් භාවිතයට ගත යුතුය. |

**3.7 රජයේ නිලධාරින් ඇප තැබීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 612 වැනි අධිකාරය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 95 දෙනෙකු සඳහා අනුමත කර තිබුණු රු.1,380,528 ක ඇප මුදල් අය කර නොතිබුණි. | මෙතෙක් ඇප තැන්පත් නොකළ නිලධාරීන්ගෙන් අදාළ ඇප මුදල මාසික වැටුපෙන් වාරික වශයෙන් අය කිරීමට කටයුතු කරන බව. | අදාළ රෙගුලාසි අනුව නියමිත ඇප ලබාගත යුතුය. |

**3.8 පාඩු හා හානි**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තවදුරටත් අය කර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැර දැමීමට තිබුණු අවස්ථා 3 කට අදාළ රු.518,776 ක අලාභ පැවති අතර, ඉන් එක් අවස්ථාවකට අදාළ රු.430,000 ක අලාභය වසර 32 කට පෙර සිදුවී තිබුණි. | දක්වා තිබෙන කරුණු පිළිගන්නා බව. | අලාභ අවම කර ගැනීමටත් සිදුවූ අලාභ සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමටත් පියවරගත යුතුය. |

**3.9 කළමනාකරණ දුර්වලතා**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 1998 වර්ෂයේදී කුකුල් වසූරිය එන්නත් සාර වඩි 1,500,000 ක් ආනයනය කර තිබුණු අතර, ඉන් වඩි 637,300 ක් පමණක් ක්ෂේත්‍රය තුළ භාවිතයට ගෙන තිබුණි. ඒ අනුව එන්නත් වඩි 862,700 ක් භාවිතයට නොගෙන තිබීම නිසා 2000 වර්ෂයේදී කල් ඉකුත්වී තිබුණු අතර, එහි වටිනාකම රු.948,970 ක් විය. මෙම අලාභය 2021 වර්ෂයේදී පොත්වලින් කපාහැර තිබුණි. | ක්ෂේත්‍රයෙන් ඉල්ලුම අඩුවීම නිසා මෙම කල් ඉකුත්වීම සිදුව තිබුණ බවත්, මින් ඉදිරියට අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන සැපයුම් කරන බව. | අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන ප්‍රසම්පාදන කටයුතු කිරීමට සහ මිලදීගත් ද්‍රව්‍ය ප්‍රශස්ථ ලෙස භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරිනියකට 2019 ජූනි සිට උපලේඛනගත නිවාසයක පදිංචිය සඳහා වෙන්කර දී තිබුණු අතර 2021 දෙසැම්බර් 31 දිනට නිවාස කුලිය රු.201,305 ක් අඩුවෙන් අයකරගෙන තිබුණි. | හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කරන බව. | ආයතන සංග්‍රහය අනුව නියමිත කුලී අයකළ යුතුය. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුව තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" පිළිබඳව දැනුවත්ව දෙපාර්තමේන්තුවේ කාර්යයන්ට අදාළ තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මෙන්ම එම ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගෙන තිබුණු නමුත් තිරසර සංවර්ධන ඉලක්කයන්හි ළඟාවීම මැන බැලීම සඳහා සුදුසු දත්ත පදනමක් සැලසුම් කර නොතිබුණි. | 2022 වර්ෂයට අදාළ සැලසුම් තුළ ඇතුළත් බව. | ඉලක්කයන් කරා ළඟාවීම මැන බැලීම සඳහා සුදුසු දත්ත පදනමක් සැලසුම් කළ යුතුය. |

**5. මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 28 ක පුරප්පාඩු 61 ක් පැවති අතර එම පුරප්පාඩු අතර අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරක්ද, අධ්‍යක්ෂ තනතුරු 6 ක්ද, ප්‍රධාන විද්‍යාඥ තනතුරු 6 ක් හා පශු විමර්ශන නිලධාරි තනතුරු 7 ක පුරප්පාඩු පැවතුණි. | පිළිතුරු සපයා නැත. | දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘතිවලට අදාළ අවශ්‍යතා අනුව පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 103 ක් පැවති බැවින් ක්ෂේත්‍ර කාර්යයන් කරගෙන යාමේදී අපහසුතා පැන නැගී තිබුණි. | පිළිතුරු සපයා නැත. | - එම - |